**කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2014**

**------------------------------------------------------------**

කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීනයේ එක්සිම් බැංකුව අතර 2009 අගෝස්තු 06 දින එළඹි ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------------------------**

ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහ මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. පැයට කිලෝමීටර 80-100 ක වේගයක් සහිත ගාස්තු අය කරන මං තීරු හතරකින් යුත් කිලෝමීටර 25.8 ක අධිවේගී මාර්ගයක් සැලසුම් කිරීම හා ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ කොටස් හතරකට බෙදීමටත් චයිනා මෙටලර්ජිකල් ගෲප් කොපරේෂන් වෙත තනි ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්තුව ලබා දීමටත් 2008 අගෝස්තු 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි. තවද,රු. මිලියන 34,722 කට සමාන එ.ජ.ඩො. මිලියන 292 ක මූලික ඇස්තමේන්තු පිරිවැයෙන් සියයට 85 ක් එනම් රු. මිලියන 29,750 කට සමාන එ.ජ.ඩො. මිලියන 248.2 ක් මූල්‍යනය කිරීමට චීනයේ එක්සිම් බැංකුව සමඟ කොන්ත්‍රාත් හතරකට එළඹීමට 2008 සැප්තැම්බර් 11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 අගෝස්තු 18 ආරම්භ කළ අතර 2013 ඔක්තෝබර් අවසන් කර ඇත. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අගයන් සහ හෙළිදරව්

කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයේ අරමුදලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වන වත්කම් සහ වගකීම්, හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ වූ ජංගම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති රු. 100,532,613 ක ශේෂය, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතිය සමඟ වූ ජංගම ගිණුමේ දක්වා ඇති රු. 101,523,613 ක ශේෂය සමඟ නොගැලපුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

----------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

----------------------

මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| එක්සිම් බැංකුව | 248.2 | 29,750 | - | - | - | 248 | 29,730 |
| ශ්‍රී.ලං.ර | 43.8 | 4,972 | 487 | - | 487 | - | 12,589 |
| රේඛීය අමාත්‍යාංශය | - | - | - | - | 38 | - | 38 |
| දේශීය බැංකු ණය | - | 5,897 | - | - | 2,785 | - | 2785 |
| එකතුව | **292.0** | **40,619** | **487** | **-** | **3,310** | **248** | **45,142** |

## 3.2 භෞතික ප්‍රගතිය

කොරියානු රජයේ ඉදිකිරීම් සමාගමකට රු. මිලියන 9,516 ක පිරිවැයකට 2000 ඔක්තෝබර් මාසයේදී මූලිකව පිරිනමන ලද, ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීමට අපේක්ෂිත වූ කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2003 දී අත්හිටුවා තිබුණි. කොන්ත්‍රාත්තුව අවසන් කරන අවස්ථාවේදී, මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 57 ක් එනම් රු. මිලියන 5,444 ක් මාර්ග සංවර්ධන අධිකාරිය වියදම් කර තිබුණි. පසුව 2008 දී සමස්ථ අගය මත කොන්ත්‍රාත්තුවක් ලෙස ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීමට රු. මිලියන 34,722 කට සමාන එ.ජ.ඩො. මිලියන 292 කට කොන්ත්‍රාත් වැඩ චයිනා මෙටලජිකල් ගෘෘප් කෝපරේෂන් වෙත පවරා තිබුණි. කෙසේ වෙතත් නව කැළණි පාලමේ හුවමාරුව ඉදිකිරීම්, හුණුපිටියේ උමං මාර්ගය, කටුනායක පිවිසුමේ සැලසුම් වෙනස්කම්, කෙරවලපිටිය හුවමාරුවෙහි අමතර වැඩ, ජා ඇළ ගාස්තු අය කරන අමතර පිවිසුම් මධ්‍යස්ථාන 02 ක්, බෝක්කු ආදියේ ප්‍රමාණ වෙනස් කිරීම් ආදිය වැඩ විෂය පථය වෙනස් වීම් හා මිල වැඩිවීම් වැනි විවිධ හේතු නිසා ඉදිකිරීම් වැඩ වල පිරිවැය රු.මිලියන 40,619 දක්වා පසුව වැඩිකර තිබුණි. අමතර පිරිවැය මූල්‍යනය කිරීමට චීනයේ එක්සිම් බැංකුව වෙතින් අමතර ණයක් ලබා ගැනීමට 2013 ජූලි 26 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබුණු නමුත් දේශීය වානිජ බැංකුවකින් රු. මිලියන 5,897 ක ණය පහසුකමක් මාර්ග

සංවර්ධන අධිකාරිය සලසාගෙන තිබුණි. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ අවසන් කර 2013 ඔක්තොම්බර් 27 දින මහජන භාවිතයට විවෘත කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් ගොඩ කිරීම සඳහා භාවිතා කළ මුහුදු වැලි පසුව වැඩි කළ රේට වලට සැපයීමට අමතර පිරිවැයක් දැරීමට කොන්ත්‍රාත්කරු ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙන් ව්‍යාපෘතිය විසින් රු. මිලියන 256.41 ක අමතර පිරිවැයක් දරා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති උපදේශකයින් 04 දෙනෙකු සඳහා වැටුප් හා වාහන කුලී ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 22.81 ක් ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් උපදේශකයින්ගේ දායකත්වය තහවුරු කර ගැනීමට දෛනික පැමිණීම්, වැඩ පැවරුම් හා මාසික කළ වැඩ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 3.4 ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග ඉදිකිරීම් සැලසුම් අනුව,අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කැබලි 2,583 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 වන විටත් ඉඩම් කැබලි 2,571 ක් පමණක් අත්පත් කරගෙන තිබුණි. ඉහත සඳහන් කර ඇති පරිදි අත්පත් කරගත් ඉඩම් කැබලි වලින් ඉඩම් කැබලි 1,251 ක් පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 කොටස අනුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීමේ ප්‍රමාදයන් මත ව්‍යාපෘතිය විසින් රු. මිලියන 380.42 ක් වූ පොලී මුදල් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය විසින් වසර 10 කට වඩා වැඩි කාලයක් වන්දි ගෙවීම් ප්‍රමාද කිරීම් මත සමහර පොලී ගෙවීම් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ව්‍යාපෘතිය යටතේ අවතැන් පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා පැලියගොඩ මීගහවත්ත ඉඩමක් අත්පත් කර ගැනීමේ අරමුණ සඳහා නාගරික සංවර්ධන අධිකාරියට 2001 දී රු. මිලියන 1.79 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් නාගරික සංවර්ධන අධිකාරිය 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉඩමේ හිමිකම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා නොතිබුණු බව නිරීක්ෂණය විය. නැවත පදිංචි කළ පුද්ගලයින්ට අයිතිය පවරා දීමේ ප්‍රමාදයට මෙම තත්ත්වය හේතු වී තිබුණි.

(ඇ) 2004 ජනවාරි 21 දින ප්‍රසිද්ධ කළ අංක 1324/19 දරන ගැසට් නිවේදනය යටතේ අත්පත් කර ගත යුතු ඉඩම් කැබලි අතුරින් එම ඉඩම් වල පෙර හිමිකරුවන් සමඟ වූ මතභේද හේතුවෙන් ඉඩම් ගොඩ කිරීම හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙතින් ඉඩම් කැබලි 14 ක් අත්පත් කර ගැනීමට වසර 10 කට වැඩි කාලයක් පියවර ගෙන නොතිබුණි.

## 3.5 මතභේදයට තුඩු දෙන කටයුතු

--------------------------------

කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සමාරම්භක උත්සව කටයුතු වෙනුවන් 2014 දී හා 2013 තුළදී පිළිවෙලින් රු. මිලියන 10.79 ක් හා රු. මිලියන 46.54 ක් ව්‍යාපෘතිය වැය කර තිබුණි. සමාරම්භක උත්සවේ වියදම් ඇස්තමේන්තු තොරතුරු හා අනුමත කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.